16-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, හුදෙකලාව අසුන්ගෙන, තමන් ශරීරයෙන් වෙන් වූ ජීවාත්මයක් යැයි අත්විඳිම පුහුණු වන්න. මෙයට ජීවමාන මරණය යැයි කියනු ලැබේ.

**ප්‍රශ්නය:** හුදෙකලාව යන්නෙහි අරුත කුමක්ද? ඔබ හුදෙකලාව අසුන්ගෙන සිටිනා විට අත්විඳිය යුත්තේ කුමක්ද?

**පිළිතුර:** හුදෙකලාව යන්නෙහි අරුත (ඒකායන කෙනාගේ පත්ලෙහි නැතිවීම) ඒකායන කෙනාගේ සිහිපත් කිරීමේ අසුන්ගෙන, ශරීරය අවසන් වීමට ඉඩ දීමයි. එනම්, හුදෙකලාව අසුන්ගෙන මෙසේ අත්විඳින්න: ජීවාත්මයක් වන මම, මෙම ශරීරය අත්හැර පරම පියා වෙතට යන්නෙමි. වෙන කිසිවෙකු සිහිපත් නොකළ යුතුයි. එතැන අසුන්ගෙන සිටින විට අශාරීරික වන්න, තම ශරීරයට තමා මිය ගියාක් මෙන්. මම ජීවාත්මයක්මි, ශිව් බාබාගේ දරුවෙක්මි. එපමණයි. මෙය පුහුණු වීමෙන් ඔබගේ ශරීර අවධානය නොකඩවා බිඳී යයි.

ඕම් ශාන්ති. පරම පියා පළමුවෙන්ම ඔය දරුවන්ට විස්තර කර දෙන්නේ : සුමිහිරි දරුවනි, මෙතැන සිහිපත් කිරීමේ අසුන්ගෙන සිටින විට, තමන් ජීවාත්ම යැයි සළකා දිගටම පරම පියා සිහිපත් කරන්න. ඔබගේ බුද්ධිය වෙන කොහේවත් ඇදී නොයා යුතුයි. ඔබ ජීවාත්මයන් බව ඔය දරුවන් දනී. ජීවාත්මයක් වන මම, මෙම ශරීරය තුළින් චරිත කොටසක් රඟපාන්නෙමි. ජීවාත්මය අවිනාශී වන අතර ශරීරය විනාශ වෙයි. එබැවින් ඔය දරුවන් ජීවාත්ම අවධානයට පත් වී පරම පියාගේ සිහිපත් කිරීමේ සිටිය යුතුයි. මම ජීවාත්මයක් වන අතර මෙම ඉන්ද්‍රියන් ක්‍රියා කරවීම හෝ නොකිරීම මට අයත් කාර්යයකි. තමන් ශරීරයෙන් වෙන්වී සිටින බව සැළකිය යුතුයි. පරම පියා පවසන්නේ තමන් ජීවාත්මයක් යැයි සලකන්න. තම ශරීරය දිගටම අමතක කරන්න. ජීවාත්මයක් වන මම ස්වාධීනයි. මම ඒකායන පියා මිස වෙන කිසිවෙකු සිහිපත් නොකළ යුතුයි. මම ජීවත්ව සිටින තාක්කල්, මරණීය තත්ත්වයේ සිටිය යුතුයි. ජීවාත්මයන් වන අපගේ යෝගාව දැන් පරම පියා සමඟින් විය යුතුයි. මම ලෝකයට සහ මගේ නිවසට මිය ගොස් සිටින්නෙමි. ඔබ මිය යන විට, ඔබට ලෝකය මිය යන්නේය යැයි කියැවේ. ඔබ දැන් ජීව මරණයක් ලද යුතුයි. ජීවාත්මයක් වන මම, ශිව් බාබාගේ දරුවෙක්මි. තම ශරීරය පිළිබඳ අවධානය නොකඩවා අමතක කරන්න. පරම පියා පවසන්නේ තමා ජීවාත්මයක් යැයි සළකා මා සිහිපත් කරන්න. ශරීරය පිළිබඳ අවධානය අමතක කරන්න. මෙය පැරණි ශරීරයක් නොවේද? පරණ දේවල් ඉවතට දමයි. තමා අශාරීරික බව සළකන්න. ඔබ දැන් පරම පියා සිහිපත් කරමින්ම ඔහු වෙතට යා යුතුව ඇත. මෙය කිරීමෙන් ඔබ තුළ එම පුරුද්ද ඇති වෙයි. ඔබ දැන් ආපසු නිවහනට යා යුතුයි. එබැවින් ඔබ මේ පැරණි ලොව සිහිපත් කරන්නේ කුමටද? හුදෙකලාව අසුන්ගෙන තමන් මත උත්සාහ දරන්න. භක්ති මාර්ගයේ අය, කුඩා ගුහාවක අසුන්ගෙන, නවගුණ වැලක පබළු කරකවමින් වන්දනා පවත්වති. ඔබද හුදෙකලාව අසුන් ගෙන උත්සාහ දැරිය යුතුයි. එවිට එම පුරුද්ද ඇතිවෙයි. ඔබගේ මුවින් කිසිවක් කිව යුතු නැත. මෙහි, මෙය බුද්ධිය පිළිබඳ කාරණාවකි. ඔබට උගන්වන කෙනා ශිව් බාබායි. ඔහු උත්සාහ දරන්නේ නැත. උත්සාහ දරන්නේ මේ බාබායි. ඔහු ඉන්පසු ඔය දරුවන්ට විස්තර කර දෙයි. අසුන්ගෙන, මේ අන්දමට පුළුවන් තරම් ඥානය ආවර්ජනය කරන්න. අපි දැන් අපගේ නිවහනට ආපසු යා යුතුයි. මෙම ශරීර මෙහි අත්හළ යුතුයි. පරම පියා සිහිපත් කිරීමෙන් පමණයි ඔබගේ පාප දුරු වී ඔබගේ ආයුෂ වැඩි වන්නේ. ඔබ නිරතුරුව මේ පිළිබඳව ඇතුලාන්තයෙන් සිතමින් සිටිය යුතුයි කිසිවක් ශබ්ද නගා කීමට අවශ්‍ය නැත. භක්ති මාර්ගයේ සමහරුන් බ්‍රහ්ම තත්ත්වය සිහිපත් කරන අතර, සමහරු ශිවාව වුවද සිහිපත් කරයි, එහෙත් එම සිහිපත් කිරීම නිවැරදි නැත. ඔවුන්ට පරම පියාගේ හැඳින්වීම නොමැති බැවින්, ඔහුව නිවැරදිව සිහිපත් කරන්නේ කෙසේද? ඔබට දැන් පරම පියාගේ හැඳින්වීම ලැබී තිබේ. උදේ පාන්දරින් පිබිද, හුදෙකලාව හිඳ, මේ අන්දමින් තමන්ටම කතා කරගන්න. ඥාන සාගරය කළඹා පරම පියා සිහිපත් කරන්න. බාබා, මම දැන් සැබවින්ම ඔබගේ උකුළට එන්නට ඉතාමත් ලඟයි. මෙය ආධ්‍යාත්මික උකුළයි. එබැවින් තමන්ටම මෙසේ කතා කරන්න. බාබා පැමිණ ඇත. බාබා සෑම චක්‍රයකම පැමිණ අපට රාජයෝගා උගන්වයි. පරම පියා පවසන්නේ මා සිහිපත් කරන්න ඒ සමඟම චක්‍රය සිහිපත් කරන්න. ඔබ ස්වදර්ශන චක්‍රධාරීන් විය යුතුයි. මුළු චක්‍රයම පිළිබඳ ඥානය ඇත්තේ පරම පියාට පමණයි. ඔහු දැන් ඔබට එය ලබා දෙයි. ඔහු ඔබව ත්‍රිකාලදර්ශී බවට පත් කරවයි. ඔබ තුන් කාලය පිළිබඳව දනී, එනම් මුල, මැද සහ අවසානය. පරම පියා උත්තරීතර ජීවයයි. තමන්ගේම ශරීරයක් ඔහුට නොමැත. ඔහු දැන් මෙම ශරීරයේ අසුන් ගෙන ඔබට විස්තර

කරමින් සිටියි. මෙය ආශ්චර්යමත් කාරණයකි. ඔහු භාග්‍ය රථයට පැමිණෙන බැවින් අනිවාර්යෙන්ම තවත් ජීවාත්මයක් ද සිටිය යුතුයි. එය මොහුගේ උපත් රාශියක අවසන් උපතයි. ඔහු පසුව අංක එකේ අපවිත්‍රභාවයට පත් වූ, අංක එකට සිටි පාරිශුද්ධ ජීවාත්මයයි. ඔහු තමන් පරමාත්ම දෙවියන් හෝ විෂ්ණු ආදිය යැයි නොකියයි. මෙහි සිටින එකම ජීවාත්මයක්වත් පාරිශුද්ධ නැත සැවොම අපවිත්‍රයි. එබැවින් බාබා ඔය දරුවන්ට විස්තර කර දෙයි ඥානය මේ අන්දමින් කළඹන්න එවිට ඔබ තුළ සතුට රැඳෙයි. මේ සඳහා අනිවාර්යෙන්ම හුදෙකලාව අවශ්‍යයි. ඒකායන කෙනාගේ සිහිපත් කිරීමේ සිටීමෙන් ශරීරය අවසන් වෙයි. මෙයට කියන්නේ හුදෙකලාව කියායි. එවිට සම අත්හැරෙයි. සන්යාසීන් බ්‍රහ්ම තත්ත්වය හෝ පංච මහා භූතයන් සිහිපත් කර, එම සිහිපත් කිරීමේ හිඳින අතරේ ශරීරය පිළිබඳ අවධානය අත්හරියි. ඔවුන් සැළකිලිමත් වන්නේ බ්‍රහ්ම තත්ත්වය සමඟ එකතු වීමට පමණයි. ඔවුන් නිකම්ම එම අවධානයේ අසුන්ගෙන සිටියි. එම තපස්යාවේ හිඳින අතර ඔවුන් තම ශරීර අත්හරියි. භක්ති මාර්ගයේ මිනිසුන් බොහෝ සෙයින් ඉබාගාතේ යයි. මෙහි ඉබාගාතේ යෑම පිළිබඳ ප්‍රශ්නයක් නොමැත. ඔබ සිහිපත් කිරීමේ පමණයි සිටිය යුත්තේ. අවසානයේදී වෙනින් කිසිවෙකුත් සිහිපත් නොකළ යුතුයි. ඔබගේ පවුල සමඟ නිවසේ ජීවත් විය යුතු නමුත් මෙය පුහුණු වීම සඳහා ද කාලය සාදා ගත යුතුයි. ශිෂ්‍යයෙක් තම අධ්‍යාපනය ගැන බොහෝ උනන්දු වෙයි. මෙයද අධ්‍යාපනයකි. තමන් ජීවාත්මයක් යැයි ඔබ නොසළකන විට, ඔබට පරමාත්ම පියා, ගුරුවරයා සහ ගුරුද අමතක වෙයි. හුදෙකලාව අසුන් ගෙන මේ අන්දමින් ඥානය ආවර්ජනය කරන්න. වැඩ අධික නිවසක කම්පන තරංග එතරම් හොඳ නැත. වෙනත් පහසුකම් සළසාගැනීමට හැකියාව තිබේ නම්, කුඩා කාමරයක හුදෙකලාව අසුන් ගන්න. දරුවන් පාසැලට ගිය පසු මව්වරුන්ට දහවල් කාලයේ කාලය තිබේ. ඔබට ඇති ඕනෑම වේලාවක මෙය දිගටම පුහුණු වන්න. ඔබට ඇත්තේ ඔබේ එක් නිවස වන නමුත්, පරම පියාට සාප්පු බොහෝමයක් ඇති අතර ඒවායේ සංඛ්‍යාවද දිගටම වැඩිවෙයි. මිනිසුන් ඔවුන්ගේ ව්‍යාපාර ආදිය පිළිබඳව කනස්සල්ලට පත්වී ඒ පිළිබඳ සිතමින් තම නින්දද නැති කර ගනී. මෙයද ව්‍යාපාරයකි. බාබා අති විශාල කොටස් වෙළෙන්දෙකි. ඔහු බොහෝ දේවල් හුවමාරු කරයි. ඔහු ඔබගේ පරණ ශරීර ආදිය වෙනුවට අළුත් ශරීර හුවමාරු කරයි. ඔහු සැමටම මාර්ගය පෙන්වයි. ඔහු මෙම ව්‍යාපාරය කළ යුතුයි. මෙම ව්‍යාපාරය ඉතා විශාලයි. ව්‍යාපාරිකයන් සැළකිළිමත් වන්නේ තම ව්‍යාපාරය ගැන පමණයි. බාබා මෙම ව්‍යාපාරය කරන අතර ඔබටද එය කරන ලෙස කියයි. බාබාගේ සිහිපත් කිරීමේ වැඩිපුර සිටින තරමට ඔබ වැඩි කාලයක් අවදිව සිටියි. ආදායමක් උපයන විට ජීවාත්මය විනෝදමත් වෙයි. මිනිසුන් මුදල් උපයා ගැනීමට රාත්‍රී කාලයේ අවදියෙන් සිටියි. වැඩිපුර වෙළඳම් සිදුවන කාලවලදී ඔවුන් මුළු රැය පුරා වුවද තම සාප්පු විවෘතව තබයි. ඔබ රාත්‍රී කාලයේදී සහ උදේ පාන්දර ඉතා හොඳ ආදායමක් උපයා ගනී. ඔබ ස්වදර්ශන චක්‍රධාරීන් සහ ත්‍රිකාලදර්ශීන් බවට පත්වෙයි. ඔබ උපත් 21 කට ධනය රැස් කරගනිමින් සිටියි. මිනිසුන් ධනවත් වීමට උත්සාහ දරයි. ඔබ පරම පියා සිහිපත් කරන්නේ නම්, ඔබගේ පාපයන් දුරු වී ඔබට ශක්තිය ලැබෙයි. ඔබ සිහිපත් කිරීමේ වන්දනාවේ නොසිටින්නේ නම්, ඔබගේ හිස මත විශාල පාප බරක් ඇති නිසා, බොහෝ පාඩු අත් විඳියි. ඔබ දැන් රැස් කළ යුතුයි. ඒකායන කෙනා පමණක් සිහිපත් කර, ත්‍රිකාලදර්ශී වන්න. ඔබ චක්‍රයෙන් භාගයකට මෙම අවිනාශී ධනය රැස් කර ගත යුතුයි. මෙය ඉතාමත්ම වටිනා දෙයකි. ඥාන සාගරය කළඹා මුතු මැණික් ලබා ගන්න. බාබා මෙය කරන අන්දම ඔය දරුවන්ට පෙන්වා දෙයි. සමහරු බාබා, මායාගේ කුණාටු බොහෝමයක් එයි යැයි කියයි. බාබා පවසන්නේ හැකිතාක් උපයා ගන්න. මෙයයි ප්‍රයෝජනවත් වෙන්නේ. හුදෙකලාව අසුනගෙන පරම පියාව සිහිපත් කරන්න. ඔබට වෙලා ඇත්නම් දේවාල ආදියෙහි බොහෝ සේවය කළ හැක. ඔබගේ බැජ් එක අනිවාර්යෙන්ම ඔබ ළඟ තිබිය යුතුයි. ඔබ ආධ්‍යාත්මික හමුදාව බව එවිට සැම දෙනාම වටහා ගනී. ඔබ දෙව්ලොව ස්ථාපනය කරන බවද ඔබ ලියයි. ආදි සනාතන දේවි දේවතා ධර්මය තිබුණි. එය දැන් නොපවතියි එය දැන් ස්ථාපනය කරමින් තිබෙයි. ලක්ෂ්මී සහ නාරායන් ඔබගේ අරමුණ සහ ඉලක්කයයි. එක්තරා කාලයකදී, ඔබ මෙම 'විනිවිද-ආලෝකමත්' පිංතූරයද බැටරියක් සමඟින් ගම්-නියම්ගම්, නගරබද සංචාර වලදී රැගෙන ගොස්, ඔබ මෙම රාජධානිය ස්ථාපනය කරන බව සැමටම කියයි. මෙම පිංතූරය නොම්මර එකයි. මෙම පිංතූරය බොහෝ ප්‍රසිද්ධ වෙයි. ලක්ෂ්මී සහ නාරායන් පමණක් නොව ඔවුන්ගේ මුළු රාජධානියම තිබෙයි. ස්ව-රාජ්‍යය ස්ථාපනය කරමින් තිබේ. පරම පියා දැන් පවසන්නේ මන්මනභව්! පරම පියා සිහිපත් කරන්න එවිට ඔබගේ පාපයන් දුරු වෙයි. ඔවුන් කියන්නේ ඔවුන් සතියක් පුරා ගීතාව සමරනවා කියායි. මේ සියලුම සැලසුම් චක්‍රයකට පෙර කළ ආකාරයටම කරනු ලබයි. ඔබ මෙම පිංතූරය නගරය වටා ගෙන යන විට, සියලුම දෙනා එය දැක ගැනීමට ඉතාමත් සතුටු වෙයි. ඔවුන්ට කියන්න පරම පියාව සහ උරුමය සිහිපත් කරන්න. මන්මනභව්! මෙය ගීතාවේ වදනකි. ශිව් බාබා පරමාත්ම දෙවියන්ය. ඔහු පවසන්නේ මා සිහිපත් කරන්න එවිට ඔබගේ පාප දුරු වෙයි! උපත් 84 චක්‍රය සිහිපත් කිරීමෙන් ඔබ මෙය බවට පත් වෙයි.

ඔබට දිගටම පොත් පත් තෑගි කළ හැක. ශිව් බාබාගේ නිදන් ගබඩාව නිරන්තරයෙන් පිටාර ගලමින් තිබේ. ඔබ තව දුරටත් දියුණුවත්ම, බොහෝ සේවය සිදුවෙයි. අරමුණ සහ ඉලක්කය ඉතාමත්ම පැහැදිලියි. එක් රාජධානියක් සහ එක් ආගමක් තිබුණු අතර ඔබ බොහෝ ධනවත් විය. එක් රාජධානියක් සහ එක් ආගමක් තිබීම මිනිසුන්ට අවශ්‍ය වී ඇත. මිනිසුන්ට අවශ්‍ය දේවල් වල සළකුණු ඔබ ඉදිරියේ දැක ගත හැක. ඔබ කියන දේවල් නිවැරදි බව ඔවුන්ට පසුව වැටහෙයි. 100% ක් පාරිශුද්ධත්වය, සාමය සහ සතුට තිබෙන රාජධානිය, නැවත වරක් ස්ථාපනය කෙරෙමින් තිබේ. එවිට ඔබද සතුටින් සිටියි. ඔබ සිහිපත් කිරීමේ සිටින විට ඊතලය, ඉලක්කයට වදියි. ඔබ වචන ස්වල්පයක් පමණක් කතා කොට ඉන්පසු නිශ්ශබ්දතාවයට පත් වී, වැඩිපුර ශබ්දයට නොපැමිණිය යුතුයි. බාබා ගීත සහ නිසඳැස් ආදියට කැමති නැත. ඔබ බාහිර ලෝකයේ මිනිසුන්ට, තමන්ව සම නොකළ යුතුයි. ඔබගේ සෑම දෙයක්ම සම්පූර්ණයෙන්ම වෙනස්ය. තමන් ජීවාත්මයක් යැයි සළකා පරම පියාව සිහිපත් කරන්න. එපමණයි! ඒවා කියවන විට මිනිසුන් අවදි වන අන්දමේ, ඉතා හොඳ පාඨ ඔබට තිබිය යුතුයි. දරුවන් සංඛ්‍යාව නොකඩවා වැඩිවන නමුත් නිධන් ගබඩාව තවමත් පිරී පවතියි. දරුවන් දෙන ඕනෑම දෙයක් ඉන්පසු භාවිත කරන්නේ ද දරුවන්මයි. පරම පියා තමා ලඟ කිසි මුදලක් රැගෙන එන්නේ නැත. ඔබගේ දේවල් භාවිත කරන්නේත් ඔබමයි. භාරතයේ මිනිසුන් විශ්වාස කරන්නේ ඔවුන් බොහෝ දේවල් ප්‍රතිසංස්කරණය කරනවා කියායි. ඔවුන් කියන්නේ වසර පහකින් කෙතරම් ධාන්‍ය තිබේදයත්, ධාන්‍ය පිළිබඳ කිසිම අපහසුතාවයක් ඇති නොවේ කියායි, නමුත් ඔබ දන්නවා කෑමට කිසිම ආහාරයක් නොමැති වන ආකාරයේ තත්ත්වයක් ඇති වන බව. ධාන්‍ය ලාභ වනවා නොවේ. ඔය දරුවන් දන්නවා උපත් 21 කට ඔබ ඔබගේ රාජධානියේ භාග්‍යය හිමි කර ගන්නා බව. මෙම අපහසුතාවයන් ටික ඔබට දරා ගැනීමට සිදු වෙයි. 'සතුට වැනි පෝෂණයක් නොමැත' යැයි කියා තිබේ. 'ගෝප් සහ ගෝපීන්ගේ අතීන්ද්‍රීය සුඛය' යැයිද සිහිපත් කොට තිබේ. බොහෝ දරුවන් සිටියි. මෙම අංකුරයට අයත් අය පැමිණෙයි. වෘක්ෂය වැඩෙන්නේ මෙහිය. ස්ථාපනය සිදුවන්නේ මෙහිය. අන් ආගම් වල මෙසේ සිදු නොවේ. ඔවුන් උඩ ඉහළ සිට පැමිණෙයි. ඔවුන් පැමිණෙන විට ඔවුන්ගේ වෘක්ෂය ඒ වන විටත් පැළකොට අවසන් සේය. ඉන්පසු ඔවුන් අංක පිළිවෙළට නොකඩවා පහළට පැමිණෙන අතර වෘක්ෂය නොකඩවා වැඩෙයි. ඔවුන්ට කිසිම අපහසුතාවයක් නැත. ඔවුන්ට ඇත්තේ උඩ ඉහළ සිට පහළට පැමිණ ඔවුන්ගේ කොටස රඟපෑමයි. එබැවින් ප්‍රශංසාවක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. අනුගාමීන් ඔවුන්ගේ ආගමික නායකයාව අනුගමනය කොට මෙම පහළට පැමිණෙයි. විමුක්තිය ලබා ගැනීමට ඔවුන් දෙන ඉගැන්වීම් මොනවාද? කිසිවක් නැත! මෙහි, පරම පියා අනාගත දෙව් දේවතා ධර්මය ස්ථාපනය කරමින් සිටියි. අළුත් අංකුරය පැළ කරනු ලබන්නේ සංගම් යුගයේදීය. පළමුව අංකුරයක් පැළ කරන්නේ පෝච්චියකයි, පසවු එය උගුල්ලා, පොළවෙහි පැළ කරන අතර එය එහිදී නොකඩවා වැඩෙයි. ඔබ සියලුම දෙනාද අංකුරය පැළ කරයි. එවිට එය ස්වර්ණමය යුගයේ දී වැඩී ඔබට ඔබගේ රාජධානියේ භාග්‍යය හිමි වෙයි. ඔබ නව ලෝකය ස්ථාපනය කරයි. ආගමික ග්‍රන්ථ වල, වසර සියදහස් ගණනක් ගැන කියන බැවින්, කලි යුගයේ තව බොහෝ වසර ගණනක් ඉතිරි වී ඇති බව මිනිසුන් විශ්වාස කරති. ඔවුන් සිතන්නේ කලි යුගයේ තව වසර 40,000 ක් ඉතිරි වී ඇති බවත්, පියා එවිට පැමිණ නව ලොව නිර්මාණය කරන බවත්ය. මෙය එම මහාභාරත යුද්ධයම බවත්, ගීතාවේ දෙවියන් අනිවාර්යෙන්ම සිටින බවත් සමහරු විශ්වාස කරති. ඔබ ඔවුන්ට කියන්නේ ඔහු ක්‍රිෂ්ණා නොවන බවයි. ක්‍රිෂ්ණා උපත් 84 ක් ගන්නා බව පරම පියා විස්තර කර දී තිබේ. එක් උපතක මුහුණුවර, තව උපතක මුහුණුවර හා සමාන නොවන බැවින් ක්‍රිෂ්ණා මෙහි පැමිණෙන්නේ කෙසේද? මේ දේවල් ගැන කිසිවෙකු සිතන්නේ නැත. ක්‍රිෂ්ණා දෙව්ලොව කුමාරයෙක් බව ඔබට වැටහෙයි, ඉතිං ඔහු තඹ යුගයේ පැමිණෙන්නේ කෙසේද? ලක්ෂමී සහ නාරායන්ගේ පිංතූරය දෙස බැලීමෙන් ඔබට සෑම දෙයක්ම වටහා ගත හැක. ශිව් බාබා ඔබට මෙම උරුමය ලබා දෙයි. ස්වර්ණමය යුගය ස්ථාපනය කරන්නේ පරම පියා පමණයි. චක්‍රයේ සහ වෘක්ෂය ආදියේ පිංතූර ද අඩු නැත. දිනකදී, ඔබට ඇති මෙම සියලුම පිංතූර 'විනිවිද ආලෝකමත්' ස්වරූපයෙන් නිර්මාණය වෙයි. එවිට සියලුම දෙනා එවැනි පිංතූරයක් ඉල්ලයි. මෙම පිංතූර මඟින් සේවය වේගවත්ව සිදුවෙයි. කෙතරම් දරුවන් සංඛ්‍යාවක් ඔබ වෙතට පැමිණෙයිදයත්, ඔබට කිසිදු කාලයක් නොමැති වෙයි. බොහෝ දෙනෙක් පැමිණෙයි, එවිට ඔබ සතුටට පත්වෙයි. දිනෙන් දින ඔබගේ බලය වැඩි වෙයි. නාටකයට අනුව මල් වීමට ඇති අය පැමිණෙයි. බාබා, මේ කෙනාගේ බුද්ධිය අවදි කරන්න යැයි ඔය දරුවන්ට කීමට සිදුවන්නේ නැත. බාබා කිසිකෙනෙකුගේ බුද්ධිය අවදි කරන්නේ නැත. නිවැරදි වේලාවට ඉබේටම ඔවුන්ගේ බුද්ධිය අවදි වෙයි. පරම පියා ඔබට මාර්ගය පෙන්වා දෙනවා පමණයි. බොහෝ දූවරුන් මෙසේ ලියති මාගේ ස්වාමිපුරුෂයාගේ බුද්ධිය අවදි කරන්න. බාබා සෑම කෙනෙකුගේම බුද්ධිය අවදි කරන්නේනම්, සෑම කෙනෙක්ම එකට දිව්‍යලෝකයට පැමිණෙයි. ඉගෙනුමකදී උත්සාහයක් තිබිය යුතුයි. ඔබ පරමාත්ම දෙවියන්ගේ උදව්කරුවන්ය. බාබා මුළු

සත්‍යයම ඔබට කලින් කියයි. ඔබ කළ යුතුම දේවල් ඔහු ඔබට කියයි. ඔබත් සමඟ මෙම පිංතූරද, ඉනිමගේ පිංතූරයද ගෙන යන්න. නාටකයට අනුව, ස්ථාපනය සිදුවිය යුතුයි. සේවය සඳහා බාබා ඔබට දෙන උපදෙස් ගැන අවධානය යොමු කරන්න. බාබා පවසන්නේ විවිධ වර්ගවල බැජ් සිය දහස් ගණනක් සාදන්න. සැතපුම් 100 කට දුම්රිය ප්‍රවේශ පතක් මිලදී ගෙන, වටේ ගොස් සේවය කරන්න. එක් මැදිරියකින් තව එකකටත්, ඉන්පසු තවත් එකකටත් යන්න. මෙය ඉතාමත් පහසුයි. ඔය දරුවන් සේවය කිරීම පිළිබඳව බොහෝ සේ උනන්දු විය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඥාන සාගරය කලඹා ඉතා හොඳ මිණි මුතු සොයා ගන්න. ආදායමක් රැස් කර ගන්න. සැබෑ සහායකයෙක් වී සේවය කරන්න.
2. ඉගෙන ගැනීමට බොහෝ සේ උනන්දු වන්න. කාලය ඇති ඕනෑම විටෙක හුදෙකලාව සිටින්න. ජීවත්ව සිටින අතරතුර, තම ශරීරයෙන් මිය යාම පුහුණු වන්න. මෙම තත්ත්වය නොකඩවා අත්විඳ, ශරීරය පිළිබඳ අවධානය අමතක කර දමන්න.

**වරදානය:** ඔබේ ප්‍රධාන සංස්කාරය පරිවර්තනය කිරීමෙන් ඔබ ආදර්ශයක ප්‍රතිමූර්තියක් වී, එමඟින් ලෝකය පරිවර්තනය කරත්වා.

ඔබ සෑම කෙනෙකුටම එක් ප්‍රධාන සංස්කාරයක් ඇත, එය ඔබ ඔබේ ස්වභාවය ලෙස හඳුන්වන අතර, වරින් වර, එය ඔබට ඉදිරියට යාමට බාධාවක් බවට පත්වේ. එම ප්‍රධාන සංස්කාරය පරිවර්තනය කරන අය බවට පත් වී ආදර්ශයන්ගේ ප්‍රතිමූර්තියක් වන්න, මන්ද, එවිට පමණක් මුළු ලෝකයම පරිවර්තනය වනු ඇත. දැන්, කිසිවෙකුට "මෙය ආරම්භයේ සිටම කෙනෙකුගේ සංස්කාරයයි" යැයි පැවසිය නොහැකි තරමේ පරිවර්තනයක් ගෙන එන්න. එම පැරණි සංස්කාරය කිසිඳු ප්‍රතිශතයකින් නොපෙනෙන විට සහ එහි එක් හෝඩුවාවක්වත් පෙනෙන්නට නොමැති විට, ඒ ගැන කතා නොකරන විට, ඔබ සම්පූර්ණ පරිවර්තනයක ආදර්ශයක ප්‍රතිමූර්තියක් ලෙස හඳුන්වනු ඇත.

**පාඨය:** උත්සාහ කිරීමේ කාලය දැන් ගෙවී ගොස් ඇත, එබැවින් ඔබේ ජීවිතය පරිවර්තනය කිරීමට ඔබේ හදවතේ පොරොන්දුවක් ඇතිකර ගන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගාවේ බලයන්ගෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබ විද්‍යාව භාවිත කරන විට, විද්‍යාව ඉතා හොඳ කාර්යයක් කරන බව ඔබට වැටහේ. එලෙසම, නිශ්ශබ්දතාවයේ බලය තුළින් අත්හදා බැලීම් සිදු කරන්න. මේ සඳහා, ඒකාග්‍රතාවය පුහුණුවීම වැඩි කරන්න. ඒකාග්‍රතාවයේ ප්‍රධාන පදනම වන්නේ මනස පාලනය කිරීමේ බලය වන අතර එමඟින් ඔබේ මනසෙහි බලය වැඩි වේ. මේ සඳහා, හුදෙකලාවේ සිටින්න.